# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No
10120

ෆැක්ස්
தொலைநகல
Fax
011-

දුරකථන
தொலைபேசி
Telephone
011-2887973
(HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site
www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail
dir.media@police.gov.lk


---

මගේ අංකය
எனது இலக்கம்
My NO
1328/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No
/ 2024

දිනය
திக
Date
16/08/2024
පැය 0540

## මාධ්‍ය නිවේදනය

**01. දේපල සොරකමකට සම්බන්ධ සැකකරුවෙකු අයිස් මත්ද්‍රව්‍ය සමඟ අත්අඩංගුවට - වත්තල පොලිස් ස්ථානය.**

2024.08.15 වන දින වත්තල පොලිස් වසමේ නිමලගිරිවත්ත ප්‍රදේශයේදී වත්තල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත 2024.08.11 වන දින එම පොලිස් වසමේදී රාත්‍රී කාලයේ නිවසක් බිඳ දේපල හා මුදල් සොරකම් කිරීම සම්බන්ධයෙන් අවශ්‍යාව සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර සැකකරු පරීක්ෂා කිරීමේදී ඔහු සන්තකයේ තිබී **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 07 මිලිග්‍රෑම් 200** ක් පොලිස් භාරයට ගෙන වත්තල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන නිමලගිරිවත්ත, වත්තල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු විසින් සොරකම් කරන ලද පා පැදියක්, ජංගම දුරකථනයක් ඇතුළු දේපල පොලිසිය විසින් සැකකරුගෙන් සිදුකළ ප්‍රශ්න කිරීම්වලදී අනාවරණය කරගත් තොරතුරු අනුව සොයාගෙන ඇත. වත්තල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. හෙරොයින් සමඟ සැකකරුවකු අත්අඩංගුවට - මොරටුව පොලිස් ස්ථානය.**

2024.08.15 වන දින රාත්‍රී කාලයේදී මොරටුව පොලිස් වසමේ ලුනාව ප්‍රදේශයේදී මොරටුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 320 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන ලුනාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. හෙරොයින් සමග සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - මීගමුව කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.**

2024.08.15 වන දින රාත්‍රී කාලයේ මීගමුව පොලිස් වසමේ මිරිස්වත්ත සහ 20 කණුව හන්දිය යන ප්‍රදේශවලදී මීගමුව කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීම් දෙකක් සිදුකර, **හෙරොයින් ග්‍රෑම් 20 මිලිග්‍රෑම් 315 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** සහ **හෙරොයින් ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මීගමුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 31 සහ 39 වයස්වල පසුවන දූනගහ සහ මිනුවන්ගොඩ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මීගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. හෙරොයින් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.08.15 වන දින දහවල් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන ප්‍රදේශයේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 600 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 56 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05. මාරක රිය අනතුරක් - මාතලේ පොලිස් වසම.**

2024.08.15 වන දින උදෑසන කාලයේ මාතලේ පොලිස් වසමේ ඒ 09 මාර්ගයේ මන්දණ්ඩාවල හන්දිය ආසන්නයේදී දඹුල්ල දෙස සිට මාතලේ දෙසට ධාවනය වූ කැබ් රථයක් පාර මාරුවීමට ගිය පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් එම පුද්ගලයා බරපතල තුවාල ලබා මාතලේ රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 54 ක් වූ මහවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මාතලේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මාතලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. මාරක රිය අනතුරක් - හංවැල්ල පොලිස් වසම.**

2024.08.15 වන දින සවස් කාලයේ හංවැල්ල පොලිස් වසමේ ඇඹුල්ගම පනාගොඩ මාර්ගයේ ජල්තර ප්‍රදේශයේදී පනාගොඩ දෙස සිට ඇඹුල්ගම දෙසට ධාවනය වූ යතුරුපැදියක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරු පැදියක් මාර්ගයේ දකුණට හැරවීමට යාමේදී එම යතුරු පැදියේ ගැටී මාර්ගයෙන් ඉවතට පැන දුරකථන රැහැන් කණුවක ද ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදි දෙකෙහිම පැදිකරුවන් දෙදෙනා හෝමාගම රෝහලට ඇතුළත් කිරීමෙන් පසු ඇඹුල්ගම දෙසට ධාවනය වූ යතුරුපැදියේ පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 18 ක් වූ දැඩිගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය හෝමාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. හංවැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**